# රැකව අභය භූමිය

## රැකව අභයභූමියේ පිහිටීම

රැකව අභයභූමිය පිහිටා ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි රැකව නම් වූ ධීවර ගම්මානය ආශ්‍රිතවය තංගල්ල නගරයේ සිට හම්බන්තොට දෙසට කිලෝමීටර 8ක් පමණ පැමිණීමේදී හමුවන නෙටොල්පිටිය මන්සන්ධියෙන් දකුණු දෙසට කිලෝමීටර 3 1/2 පමණ ගිය තැන රැකව අභයභූමිය හමුවේ

## රැකව අභයභූමියේ වැදගත්කම

තලාව සිටින සාගර කැස්බෑවුන් විශේෂ හතෙන් විශේෂ පහක්ම ශ්‍රී ලංකාව අවට වෙරළ තීරයන්හි බිත්තර දැමීම සඳහා පැමිණේ් ගල් කැස්බෑවා බටු කැස්බෑවා දාර කැස්බෑවා පොතු කැස්බෑවා සහ ඔළුගෙඩි කැස්බෑවා යන කැස්බෑ විශේෂ 5 මෙසේ ශ්‍රී ලංකාවේ බිජුලන කැස්බෑ විශේෂ වෙති මෙම සියළුම විශේෂ රැකව වෙරළේදී දැකගත හැකිවීම විශේෂත්වයකි ශ්‍රී ලංකාවේ ඇති වෙනත් වෙරළ තීරයන්ට වඩා රැකව වෙරළට බිත්තර දැමීම සඳහා කැස්බෑවුන් සුලභව පැමිණෙති (වසරකට කැදළි 700-800 පමණ) එබැවින් රැකව වෙරළ තීරය යනු මුහුදු කැස්බෑවුන්ගේ පාරාදීසයකි

කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය හෙවත් ටී සී පී ආයතනය රැකව වෙරළට පැමිණියේ 1993 වසරේදිය රැකව ධීවර ගම්මානයේ ගම්වාසීන් විසින් දශක ගණනාවක් පුරාම කැස්බෑවුන් දමන සියළුම බිත්තර එකතුකරගනු ලැබුවේ ආහාර ලෙෂ ගැනීමට සහ විකිණීමටය මීට අමතරව පණපිටින් කැස්බෑවුන් යාපනයට යැවීමක්ද සිදුවිය රැකව වෙරළ ආසන්න මුහුදේ හිරිගල් පර විනාශය කඩොලාන කැපීම හුණු සඳහා සිප්පිකටු හැරීම වැලි ගොඩ දැමීම වැනි පරිසර විනාශකාරී ක්‍රියාවන් රැසක ප්‍රතිඵලයක් ලෙෂ සාගර කැස්බෑවුන්ගේ ගහණයද දිනෙන් දින අඩුවිය වර්ථමානය වන විට සියලුම කැස්බෑ විශේෂ වඳවීයාමේ තර්ජනයට මුහුණපා සිටින අතර දාර කැස්බෑවා සහ පොතු කැස්බෑවා උග්‍රලෙෂ වඳවීයාමට මුහුණදී ඇති විශේෂ දෙකකි

1996 වසරේ සිට කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය කැස්බෑ බිත්තර එකතුකර විකිණීමෙන් ජීවත්වූ රැකව ප්‍රදේශවාසීන්ද සමගින් රැකව වෙරළේ කැස්බෑවුන් සංරක්ෂණය කිරීමේ සත් කාර්යයක් ආරම්භකරණ ලදී මෙම වැඩසටහන යටතේ රැකව ගම්වාසීන් කැස්බෑ කැදළි ආරක්ෂකයින් ලෙස රැකව වෙරළෙහි මුර සංචාර සඳහා සේවයේ යොදවනු ලැබූ අතරම ඔවුන් පරිසර හිතකාමී සංචාරක මාර්ගෝපදේශකයින් ලෙසද පුහුණු කරන ලදී මෙම වැඩසටහන සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයත් සෘජුවම දායක වී ඇත

## රැකව අභයභූමියේ උපත

1996 වසරේ සිට 2006 වසර දක්වා කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතියේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් රැකව ප්‍රජාව සමගින් අත්වැල් බැඳගෙන සාගර කැස්බෑවුන් සජරක්ෂණය කිරීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන එනු ලැබිණි 2006 වසර ජගත් සාගර කැස්බෑවුන්ගේ වසර ලෙෂ නම්කරනු ලැබීමත් සමගම එය සැමරීම සඳහා විශේෂ කැස්බෑ සංරක්ෂණ වැඩසටහන් රැසක් ශ්‍රී ලංකාවේද ක්‍රියාත්මක කරණ ලදී එහි එක් ප්‍රතිඵලයක් ලෙෂ

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු මගින් රැකව වෙරළ තීරය 2006 මැයි මස 25 වන දින අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් අභයභූමියක් ලෙෂ ප්‍රකාශයට පත්කරණ ලදි තවද කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතියක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව චන්ද්‍රිකා තාක්ෂණික උපකරණ යොදා සාගර කැස්බෑවුන් මුදා හැරීමක්ද සිදුකරණ ලදි

**රැකව අභයභූමියේ සිදුකරණ පර්යේෂණ සහ සංරක්ෂණ ක්‍රියාකාරකම්**

සාගර කැස්බෑවුන් විසින් රැකව වෙරළෙහි තැන්පත් කරණ සියළුම කැදළි කම්බි දැලකින් ආවරණය කරනු ලබන්නේ විලෝපිකයින්ගෙන් ආරක්ෂාකර ගැනීමටය මෙයට අමතරව බිජුලන කැස්බෑවුන්ගේ ශරීරයේ දිග ෂහ පළල මැනීම දමන බිත්තර ප්‍රමාණය ගණන් කිරීම කැස්බෑවාට ටැග් සළකුණක් යෙදීම යනාදි මූලික පර්යේෂණද මෙහිදී සිදුකෙරේ චන්ද්‍රිකා තාක්ෂණික උපකරණ යොදා කැස්බෑවුන් මුදා හැරීමෙන් කැස්බෑවුන්ගේ සංක්‍රමණික රටා හඳුනාගැනීම සිදු කරණ අතර මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල ඉතාමත් සිත්ගන්නා සුළුවිය

රැකව අභයභූමිය මගින් ආරක්ෂාව සැලසෙනුයේ සාගර කැස්බෑවුන්ට පමණක් නොව කොරල්පර මුහුදු තෘණ වෙරළබඩ ශාක ඇතුළුව අභයබළුම ශාක සහ ෂතුන්ටද එමගින් ආරක්ෂාව සැලසේ එපමණක්ද නොව වෙරළාසන්න ඉදිකිරීම් ආලෝක දූෂණය වෙරළට කැළි කසල බැහැර කිරීම වෙරළබඩ කැළෑ විනාශය කඩොලාන විනාශ කිරීම වැනි සාගර කැස්බෑවුන්ට අහිතකර තත්ත්වය ඇති කරණ ක්‍රියාකාරකම් සිදුවන්නේ නම් ඒවා පාලනය කිරීමටහද වන ෂත්ත්ව සහ තුරුලත් ආරක්ෂක ආඥා පනත ප්‍රතිපාදන සපයයි

ඔබැවින් රැකව අශයභූමිය තුල කිසියම් හෝ නීති විරෝධී කටයුත්තක් සිදුවන්නේ නම් නොපමාව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතියට දැනුම් දෙන්න

එය ඔබගෙන් ඉටුවිය යුතු වගකීමකි

රැකව අභයභූමිය යනු වෙරළබඩ සම්පත් අතින් අනූන ස්ථානයකි පර්යේෂකයින්ට එය කදිම විද්‍යාගාරයකි සාගර කැස්බෑවුන්ට අමතරව විවිධ විශේෂයන්ට අයත් කොරල්පර මුහුදු ඇල්ගී මුහුදු තෘණ පර අශ්‍රිත මසුන් විවිධ ක්‍රස්ටේශියාවන් මුහුදු ඉකිරියන් වැනි එකයිනඩමාටාවන් විවිධ බෙල්ලන් විශේෂ මුහුදු කැකිරි බංගුර පසගිල්ලන් මුහුදු ඇනිමනි වැනි ෂත්ත්ව සහ ශාක විශේෂ සහිත වෙරළබට ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් ස්ථානයකි

රැකව අභයභූමිය යනු ප්‍රජා මූලික වනජීවී ආරක්ෂිත ප්‍රදේශ කළමණාකරණයෙහි ආදර්ශයකි රැකව කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය ජගත් පැසසුමට ලක්වූ ප්‍රජා මූලික වැඩසටහනකි එය සුරැකීමට ඔබත් දායක වන්න

ඔබත් රැකව අභයභූමියට පැමිණ එහි ඇති සුන්දරත්වය රසවිදින්න සුන්දර මතක සටහන් පමණක් නැමත රැගෙන යන්න

**ඔබ කැස්බෑවුන් නැරඹීමට රැකව අභයභූමියට පැමිණිවිට**

පළමුව එහි සේවයේ නියුතු පර්යේෂණ නිළධාරියෙක් හෝ සංචාරක මාර්ගෝපදේශකයෙක් හමුවීන් නිතරම ඔවුන්ගේ උපදෙස් පිළිපදින්න

වෙරළෙහි ඇවිදින විට විදුලි පන්දම් හැකිතාක් අවම ලෙෂ භාවිතා කරන්න ආලෝකය කැස්බෑවුන්ට හානි ගෙනදෙයි

වෙරළෙහි සිටින කැස්බෑවුන් කෘතිම ආලෝකයෙන් ඡායාරූප ගත නොකරන්න එය කැස්බෑවුන්ට හානියකි

සැමවිටම බිත්තර දැම්ම අරඹනතුරු මීටර 50ක් වත් කැස්බෑවාට දුරින් නිෂ්ශබ්දව සිටින්න කැස්බෑවුන් නැරඹීමේදි කැස්බෑවාගේ පිටුපසින් හෝ පැත්තෙන් සිට නරඹන්න

කිසිදු අවස්ථාවක කැස්බෑවාගේ මුඛය අසලට අත නොයවන්න ඇතැම් සපා කෑමට ඉඩ ඇත

බිත්තර ඇල්ලීමෙන් වලකින් කැදැල්ල තුලට කිසිදු ආගන්තුක දෙයක් නොදමන්න එමගින් බිත්තර දිළීර බැක්ටීරියා ආසාදනයට ලක්විය හැකිය

වෙරළෙහි මත්පැන් පානය රාත්‍රියට දිවීම ඉවතලන දෑ වෙරළට දැමීම ගිණිමැල ගැසීම අධික ශබ්ද ඇතිකිරීම සිදුනොකරන්න

කැස්බෑවුන් ගැන ඔබ නොදන්නා දේ පර්යේෂණ නිළධාරින්ගෙන් හෝ සංචාරක මාර්ගෝපදේශකයින්ගෙන් අසා දැනගන්න